GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

04-08-2012

**මධ්‍ය නිවේදනය**

අද දින 04-08-2012 මධ්‍යම පලාත තුල මහනුවර ශික්ෂණ රෝහල ඇතුලත්ව සියලුම රෝහල් වල වෛද්‍යවරුන් වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තීරණය කොට ඇත.කෙසේ වෙතත් මානුෂීය පදනමේ සිට සිරිමාවෝ බණ්ඩාරණායක ළමා රෝහලේ කටයුතු හා අනෙකුත් රෝහල්වල හදිසි අනතුරු කටයුතු සඳහා ප්‍රතිකාර දීමට අප තීරණය කර ඇත.

එයට හේතුව වුයේ මධ්‍යම පලාත් සෞඛ්‍ය ඇමතිවරයා ඊයේ (03-08-2012) පස්වරු 3.50 පමණ පලාත් සෞඛ්‍යසේවා අධ්‍යක්ෂකතුමියට හා මධ්‍යම පලාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥ සපුමල් ධනපාල මහතාට අසභ්‍ය වචනයෙන් බැන වැදි තර්ජන කිරීමත් ඉන් පසු ආදාල විශේෂඥ වෛද්‍යවරයාට පහර දීමත් සිදු කිරීමත්ය. මෙහිදී තුවාලලැබූ විශේෂඥ වෛද්‍යවරයා මේ වන විට මහනුවර මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

අපට දැනගන්න ලැබී ඇති පරිදි මෙම පලාත් සෞඛ්‍ය ඇමතිවරයා නිතීඥවරයෙකු වන අතර එම වෘත්තිය අචාරධර්ම වලට පවා පටහැනිව කටයුතු කර ඇති බව පෙනී යයි. මේ අනුව අදාල මධ්‍යම පලාත් සෞඛ්‍ය ඇමතිවරයාගේ ක්‍රියාකලාපය දැඩි පිලකුලෙන් හා අප්‍රසාදයෙන් යුතුව හෙලා දකින අප සංගමය ඔහු වහාම අත්අඩංගුවට ගෙන නීතිය හමුවට ඉදිරිපත් කල යුතු බව තරයේ අවධාරණය කරන්නෙමු.

එසේ නොවුන හොත් අප සංගමයේ විධායක සභාව ඉදිරියේදී ගත යුතු ත්‍රියා මාර්ග තීරණය කරනු ඇත.

මෙම කරුණු මුල් කරගෙන අද දිනයේ මධ්‍යම පලාත තුල ක්‍රියාත්මක වන මෙම වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයට අමතරව නීතීඥවරයෙකු වන මෙම ඇමතිවරයාගේ පිලිකුල්සහගත හැසිරීම නිතීඥ සංගමයටද දැනුම් දීමට අප කටයුතු කරනු ඇත.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩි විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444